Department Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව

විෂය- ගණිතය

සතිය- 29

ශ්‍රේණිය -10

Prepared by- කෑ/දෙහි හක්බෙල්ලාවක ක. විද්‍යාලය

# දෙවන වාරය පුනරීක්ෂණ අභ්‍යාසය - 1

01. පහත දැක්වෙන වීජීය භාග සුළු කරන්න.

i. $\frac{m}{5}+\frac{m}{5}$ ii. $\frac{3}{y}+\frac{2}{y}$ iii. $\frac{3}{5b}-\frac{2}{5b}$

iv. $\frac{5}{2y}-\frac{1}{3y}+\frac{2}{5y}$ v. $\frac{5}{2b}-\frac{3}{2b}+\frac{7}{2b}$ vi. $\frac{3x}{4}+\frac{2x}{3}-\frac{5x}{6}$

vii. $\frac{2}{p-3}+\frac{3}{p-2}$ viii. $\frac{3}{y+2}-\frac{2}{y-2}$ ix. $\frac{8}{5m-2}-\frac{3}{3m-4}$

x. $\frac{7}{2(a-3)}+\frac{5}{3(a-1)}$ xi. $\frac{q+2}{q^2-4}+\frac{3}{q+2}$ xii. $\frac{2}{3(a-2)}-\frac{3}{a-1}-\frac{4}{1-a}$

xiii. $\frac{4}{a+2}-\frac{3}{a-2}+\frac{5}{a^2-4}$ xiv. $\frac{3}{y+3}+\frac{4}{y^2+5y+6}$ xv. $\frac{2}{n+2}+\frac{3}{n^2+6n+8}$

02. ප්‍රතිශතයන් හා ප්‍රමාණයන් සොයන්න.

i. රුපියල් 25 ක් රුපියල් 100 ක ii. ශත 50 ක් රුපියල් 1 ක

iii. රුපියල් 1000 කින් 20% ක් iv. 20 $l$ කින් 25% ක්

03. නගර සභා බල ප්‍රදේශයක පිහිටි කඩ කාමරයක් සඳහා වාර්ෂික තක්සේරු වටිනාකම රුපියල් 60,000 කි. මේ සඳහා 10% ක වාර්ෂික වරිපනම් බදු මුදලක් අය කෙරේ නම් කාර්තුවකට ගෙවිය යුතු වරිපනම් බදු මුදල ගණනය කරන්න.

04. වාර්ෂික වටිනාකම රුපියල් 100,000 ක් ලෙස තක්සේරු කර ඇති නගර බද පිහිටි සුපිරි නිවසක් සඳහා කාර්තුවකට රුපියල් 2,500 ක වරිපනම් බදු මුදලක් ගෙවනු ලබන්නේ නම් අය කරනු ලබන වරිපනම් බදු ප්‍රතිශතය ගණනය කරන්න.

05. එක්තරා මෝටර් බයිසිකලයක ආනයනික වටිනාකම රුපියල් 150,000 කි. එහි වටිනාකමින් 10% ක් තීරු බදු ලෙස ගෙවිය යුතු නම් අය කරනු ලබන තීරු බදු මුදල ගණනය කරන්න.

06. රුපියල් 500,000 ක් වටිනා ඇඳුම් තොගයක් ආනයනය කිරීමේ දී ගෙවීමට සිදු වූ තීරු බදු මුදල රුපියල් 20,000 ක් නම් අය කර ඇති තීරු බදු ප්‍රතිශතය ගණනය කරන්න.

07. එක්තරා පුද්ගලයෙකුගේ වාර්ෂික ආදායම රුපියල් 2,000,000 ක් විය. පළමු රුපියල් 500,000 ක මුදල ආදායම් බද්දෙන් නිදහස් වන අතර ඊට පසු රුපියල් 500,000 හේ කොටස් සඳහා පිළිවෙලින් 4% ක 8% ක හා 12% ක් බැගින් ආදායම් බදු ගෙවිය යුතු වේ නම් ගෙවිය යුතු මුළු ආදායම් බද්ද ගණනය කරන්න.

08. නිවසක මාසික දුරකථන ගාස්තුව රුපියල් 2,500 කි. මේ සඳහා 15% ක එකතු කළ අගය මත බද්දක් ගෙවිය යුතු වේ. බදු සමග දුරකථන බිලේ මුළු වටිනාකම සොයන්න.

09. පහත දැක්වෙන සමීකරණ විසඳන්න.

i. $3(a-4)=21$ ii. $7(6p-5)=-14$ iii. $\frac{x}{2}+\frac{x}{2}=4$

iv. $\frac{2a}{3}+\frac{a}{3}=4$ v. $\frac{3(x-1)}{2}+2=5$ vi. $\frac{3(q+3)}{2}+4=10$

10. පහත දැක්වෙන සමගාමී සමීකරණ විසඳන්න.

i. $a+b=5$, $a-b=1$ ii. $x+2y=7$, $2x-2y=2$ iii. $p+q=8$, $2p+q=2$

iv. $a+2b=13$, $2a+5b=31$ v. $2x-y=2$, $3x+2y=17$ vi. $3p+2q=11$, $5p+3q=17$

11.පහත දැක්වෙන වර්ගජ සමීකරණ සාධක භාවිතයෙන් විසඳන්න.

i. $n^2+8n+15=0$ ii. $m^2-7m+12=0$ iii. $2a^2+35=19a$

12. විමලා හා කමලා ළග යම් යම් මුදල් ප්‍රමාණ ඇත. එම මුදල්වල ඓක්‍යයට රු. 55 ක් එකතු කල විට මුළු මුදල රු. 200 ක් වේ. කමලා ළග ඇත්තේ විමලා ළග ඇති මුදලේ දෙගුණයට රු. 95 ක් අඩුවෙනි. දෙදෙනා ළග ඇති මුදල් ප්‍රමාණ සොයන්න.

13. ළමා කමීස දෙකකත් ළමා සායකත් මුළු මිල රු. 1060 කි. ළමා කමීස එකකත් ළමා සාය තුනකත් මුළු මිල රු. 1555 කි. ළමා කමීසයක මිල රු. $x$ ද, ළමා සායක මිල රු. $y$ ද ලෙස ගෙන සමගාමී සමීකරණ යුගලයක් ඇසුරෙන් කමීසයක මිල හා සායක මිල සොයන්න.

14. $x$ නම් සංඛ්‍යාව සහ ඊට 12 කින් වැඩි සංඛ්‍යාවේ ගුණිතය 189 කි. සංඛ්‍යා දෙක සොයන්න.

15. ඍජුවෘත්ත සිලින්ඩරයක උස එහි අරයට වඩා 4 $cm$ කින් වැඩිය. එහි වක්‍ර පෘෂ්ඨ වර්ගඵලය 484 $cm^2$ ක් නම් සිලින්ඩරයේ අරය සොයන්න.